**ශීර්ෂය 304 - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙන් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං. වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින්

කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 06 (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණ මා ප්‍රකාශ කරමි.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැක. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ද මෙම වාර්තාවෙන් ඉදිරිපත් නොකෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(vi) ඡේදය ප්‍රකාරව පිළියෙල කළ යුතු අක්මුදල් ගැලපුම් ගිණුම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2019 අප්‍රේල් 03 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව අග්‍රිම ගැලපුම් ගිණුමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණු රු.4,597,737ක අග්‍රිම ශේෂය, දෙපාර්තමේන්තුවේ අග්‍රිම ගිණුමේ වූ රු.500,954 ක ශේෂය සමග ගලපා නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව අක්මුදල් ගැලපුම් ගිණුම පිළියෙල කළ යුතු වීම. | ඉදිරි වර්ෂවලදී මෙම අඩුපාඩු මගහරවා ගෙන අග්‍රිම ගැලපුම් ගිණුම නිවැරදිව පිළියෙල කිරීමට සැලසුම් කර ඇත. |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව ශුද්ධ ආදායම රු.18,089,731 ක් වුව ද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ශුද්ධ ආදායම රු.18,195,572 ක් වශයෙන් දක්වා තිබුණි. ඒ අනුව ගැලපුම් කිරීමට පෙර අග්‍රිම ගිණුමේ ශේෂයද එම ප්‍රමානයෙන් වැඩියෙන් දක්වා තිබුණි. එසේම 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ හර ශේෂය රු.4,597,939 වුවද එය අග්‍රිම ගැලපුම් කළ යුතු ශේෂය ලෙස දක්වා නොතිබුණි. | ශුද්ධ ආදායම නිවැරදිව දැක්විය යුතු අතර, අග්‍රිම ගැලපුම් ගිණුමේ ශේෂය නිවැරදිව දැක්විය යුතු වීම. | රු.105,840 ක ආපසු ගෙවූ මුදල අතපසු වීමකින් මුළු වාර්ෂික ආදායමින් අඩුකර නොතිබීමෙන් මෙම වරද සිදු වී ඇත. |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ රු.3,602,667 ක් වූ තැන්පත් ලැබීම් හා රු.2,664,272 ක් වූ තැන්පත් ගෙවීම් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ දක්වා නොතිබුණි. තවද රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් වලින් අයකර තිබුණු ණය වාරික | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතු වීම. | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු සැලකිල්ලට ගනිමින් ඉදිරියේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල |

| | |
|---|---|
| වට්නාකම වූ රු.10,039,322 ක් හා ණය ආපසු ගෙවීම් රු.9,175,679 ක් වූ වට්නාකම ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ දක්වා නොතිබුණි. | කිරීමට කටයුතු කරනු ලැබේ. |

**1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතුව පැවති රු.86,392 ක් වූ ණය ශේෂ ණයගැති ලේඛනය තුල ඇතුලත් කර නොතිබුණි. | ණයගැති ලේඛනය නිවැරදිව පවත්වා ගත යුතු වීම. | අත් වැරදිමකින් ණය ලේඛනය තුල සටහන් කිරීමට නොහැකි වී ඇත. එම වරද නිවැරදි කිරීමට සටහන් කර ඇත. |
| (ආ) | වර්ෂ 05 ට පෙර සේවය හැර ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.146,072 ක ණය ශේෂය හා මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.6,100 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට හෝ මහා භාණ්ඩාගාරයේ එකඟත්වය මත කපා හැරීමට කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොමැත. |

**1.6.5 තැන්පතු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 571 පරිදි වර්ෂ 02 ඉක්ම වූ නිරවුල් කර ගත යුතුව පැවති රු.209,834 ක් වූ තැන්පතු අවස්ථාවෝචිත පරිදි රජයේ ආදායමට බැර කළ යුතු වුවත් එසේ කර නොතිබුණි | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව අවශ්‍ය කටයුතු සඳහා පියවර ගැනීමට කටයුතු කර ඇත. |

### 1.6.6 දේපල පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2016 වර්ෂයෙන් පසුව මිලට ගෙන තිබුණු වෙනත් යන්ත්‍ර හා උපකරණ ඒවායේ සත්‍ය වටිනාකම මත ගිණුම් ගත කිරිම හා එම වර්ෂයට පෙර මිලදී ගත් වත්කම් තක්සේරු කිරීම සඳහා පත්කර තිබුණු කමිටු වාර්තාවේ නිර්දේශය මත ඒවායේ තක්සේරු වටිනාකම ගිණුම් ගත කර තිබුණි. දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල 22 ක පැවති වත්කම්වල වටිනාකම හා ප්‍රධාන කාර්යාලයෙහි වෙනත් යන්ත්‍ර හා උපකරණවල කොටසක් ගිණුම් ගත කිරීම සඳහා 2018 දෙසැම්බර් 31 දින වන තෙක් පියවර ගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු සියළුම වත්කම් ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු වීම. | 2016 වර්ෂයෙන් පසු මිලට ගත් වත්කම් ඒවායේ සත්‍ය පිරිවැය මත ගිණුම්ගත කර ඇති අතර, ඊට පෙර මිලදී ගත් වත්කම් තක්සේරු කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් හරහා කමිටුවක් පත්කර ඇත. 2018 දෙසැම්බර් 31 දින වන විට ලැබුණු තක්සේරු කළ වටිනාකම් සහිත වත්කම් CIGAS වැඩ සටහන හරහා ගිණුම් ගතකර ඇත. මෙහි සඳහන් ප්‍රාදේශීය කාර්යාල හා අනෙකුත් වත්කම්වලට අදාල තක්සේරු කල වාර්ථාවන් 2018 දෙසැම්බර් 31 වන විටත් ගිණුම් අංශයට ලැබී නොමැත. |
| (ආ) 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ඩොප්ලර් රේඩාර් පද්ධතිය වෙනුවෙන් දරන ලද රු.408,825,422 ක් වු වියදම වත්කම් වශයෙන් දක්වා නොතිබුණි. | මහා භාණ්ඩාගාරයේ උපදෙස් මත මෙම වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතු වීම. | මෙම දෙපාර්තමේන්තුව විසින් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන ගොස් නොමැති අතර,ඩොප්ලර් රේඩාර් පද්ධතියට අදාල වත්කම් ඉන්වෙන්ට්‍රිගත කිරීමට අදාල ලේඛණ සොයා ගැනීමට අපොහොසත් විය. තවද , 2016 දෙසැම්බර් 31 ට පෙර මිලදී ගත් වත්කම් අගය කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් තුමා විසින් කමිටුවක් පත් කර ඇති අතර, එම කමිටුව මගින් 2018 දෙසැම්බර් 31 දින වන විට ලබාදුන් වාර්තා තුල ඩොප්ලර් රේඩාර් පද්ධතියට අදාල වත්කම් ඇතුලත් වී නොමැත. ඩොප්ලර් රේඩාර් පද්ධතිය වෙනුවෙන් ප්‍රසම්පාදනයට අදාල රු.408,825,422 ක් දරා තිබුණද, ඊට අදාල උපකරණ වර්ග හා ඒවායේ වටිනාකම් 2018 දෙසැම්බර් 31 වන විටත් ගිණුම් අංශයට නොලැබුණි. |

**1.6.7 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීන් අදහස් දැක්වීම |
|---|---|---|
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි | චක්‍රලේඛ උපදෙස් අනුව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | යාවත්කාලීන කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1 වියදම් කළමනාකරණය**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මුළු ශුද්ධ වෙන් කිරීම් රු.647,800,000 න් රු.360,766,829 ක් හෙවත් සියයට 56 ක් පමණක් උපයෝජනය කර තිබුණි. | ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී සැබෑ මූල්‍ය අවශ්‍යතාවයන් හඳුනා ගැනීමටත් ලැබී තිබුණු ප්‍රතිපාදන විචක්ෂණව උපයෝජනය කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. | අදහස් දක්වා නොමැත |
| (ආ) | ප්‍රාග්ධන වැය විෂයයන් 03 කට අදාළ රු.201,312,144 ක් වූ ප්‍රතිපාදන සියයට 27 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක් තුල ඉතිරිවීම් සිදු වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටුවන පරිදි වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | මූලතිව් කාර්යාලය අළුත්වැඩියා කිරීමට ඉදිකිරීම් හා ඉඩම පිරවීමේ කටයුතු සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අවසර නොලැබීම හේතුවෙන් ප්‍රාග්ධන වැය ඉතිරි වී තිබුණි. |
| (ඇ) | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ඇස්තමේන්තු ගත වෙන් කිරීම රු.106,000,000 ක් විය. එයින් රු.18,500,000 ක් මාරු පත්‍ර මගින් වෙනත් වැය විෂයන් වලට මාරු කිරීමෙන් පසු රු.73,315,414 ක ඉතිරියක් සිදුවී තිබුණි. | ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී සැබෑ මූල්‍ය අවශ්‍යතාවයන් හඳුනා ගැනීමටත් ලැබී තිබුණු ප්‍රතිපාදන විචක්ෂණව උපයෝජනය කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. | මිලදී ගැනීමට නියමිතව තිබූ හයිඩ්‍රජන් ජෙනරේටරය විදේශ රටකින් නිෂ්පාදනය කර ලබාගැනීමේදී එහි පිරිවැය පිළිබඳ පූර්ව නිශ්චිත නිගමනයකට ඒමට අපහසු විය. එබැවින් 2018 අයවැය තුල මෙම වැය විෂයය අධි ඇස්තමේන්තුගත වී ඇත. මීට අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ප්‍රශ්නකාරී තත්ත්වයක් ඇති වීම හේතුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව දෙවතාවක් පත් කිරීමට සිදුවීම නිසා එම |

| | | | |
|---|---|---|---|
| | | | වාර්තා ප්‍රමාද වීම හේතුවෙන් මෙම මිලදී ගැනීම සිදුකිරීමට නොහැකි විය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල පරිපූරක ඇස්තමේන්තුවක් මගින් රු.200,000,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර ඉන් රු.2,197,115ක් පමණක් වියදම් දැරීම හේතුවෙන්රු.197,802,805 ක ප්‍රතිපාදන වර්ෂය අවසානයේදී ඉතිරි වී තිබුණි. | -එම- | ව්‍යාපෘතිය සඳහා භාවිතා කල වාහනය දෙපාර්තමේන්තුව යටතට ගැනීම,දෙපාර්තමේන්තු ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමක් වන බැවින් එහි රේගු ගාස්තු ගෙවීම සඳහා මෙම මුදල් භාවිතා කරන ලදි. |

**2.2** **බැරකම් හා බැඳීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට නිරවුල් කල යුතුව පැවති රු.596,011 ක් වූ බැරකම්, බැරකම් ප්‍රකාශයට ඇතුලත් කර නොතිබුණි. | බැරකම් නිවැරදිව ගණනය කළ යුතු වීම. | අදහස් දක්වා නොමැත |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **සැලැසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉදිරි වර්ෂය සඳහා සකස් කළ ප්‍රසම්පාදන සැලැස්මේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ) හා 4.2.2 පරිදි පිළිවෙලින් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාල සටහනක් සකස්කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතු වීම. | අතපසු විමකින් 2018 වර්ෂයේ පිළියෙල නොකළද 2019 වර්ෂයේ සිට පිළියෙල කිරීමට කටයුතු කරනු ඇත. |

## 3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුව විසින් ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන 37 ක් දිවයින පුරා පිහිටුවා තිබුණි. මෙම පද්ධතිය හා සම්බන්ධ චන්ද්‍රිකාව පෘථිවි කක්ෂයෙන් බැහැරව පවතින බැවින් වෙනත් සන්නිවේදන මාධ්‍යයක සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදනය ප්‍රදානය කර තිබුණු ආයතනය, 2019 මාර්තු 31 දින වන විටත් එම කාර්යය සම්පූර්ණ කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය තුල මධ්‍යස්ථාන 06 කින් පමණක් දත්ත ලැබී තිබුණු බව අනාවරණය විය. තවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 ඡේදය පරිදි සියයට පහකට නොඅඩු මුදලක කාර්ය සාධන සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණ අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ඡේදය පරිදි ලියා අත්සන් කරන ලද විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් නොතිබුණි. 2018 වර්ෂය තුල ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා මධ්‍යස්ථානවල නඩත්තු කටයුතු සිදුකර නොතිබුණු බවද අනාවරණය විය. | ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන නිසියාකාරව නඩත්තු කර ක්‍රියාත්මක තත්වයට ගත යුතු අතර සන්නිවේදන සම්බන්ධතා නියමිත දිනට ලබා ගැනීමට කටයුතු කිරීම සහ කොන්ත්‍රාත් වලට එළඹීමේදී විධිමත් ගිවිසුමක් මත අදාළ ලංසු සුරක්ෂණයක් ලබා ගැනීමෙන් ප්‍රසම්පාදන පරිපාලනය පිළිබඳ කටයුතු විධිමත් කළ යුතුය. | අදාළ සන්නිවේදන සම්බන්ධතාවය සඳහා කොන්ත්‍රාත්තුවට අනුව ජාලය නිසි පරිදි ස්ථාපනය කිරීම සිදුකොට නොමැති බැවින් හා එම කාර්ය කොන්ත්‍රාත්තුවට හා අදාල පිරිවිතරයන්ට අනුව සම්පූර්ණ කරන ලෙසට අදාල ආයතනය වෙත ලිඛිත දැනුම්දීම් සිදුකර ඇත. |
| (ආ) හයිඩ්‍රජන් ජෙනරේටරයක් රු.33,275,000 (බදු රහිත) වටිනාකම ගැනීම සම්බන්ධ ප්‍රසම්පාදනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණයන් විය | | |
| i. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ඡේදය ප්‍රකාර 2019 පෙබරවාරි 28 දින වන විටත් තෝරාගත් සැපයුම්කරු සමග ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම | අදාල කොන්ත්‍රාත් ගිවිසුමට මේවන තෙක් අත්සන් තබා නොමැත. |
| ii. සාර්ථක ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිළිබඳව විධිමත්ව දැනුම් දීමට පෙර ලංසු ඉදිරිපත් කර තිබුණු | ලංසු ලියකියවිලිවල රහසෲතාවය ආරක්ෂා කිරීමට පියවර ගතයුතුය. | ප්‍රතික්ෂේපිත ලංසුකරුවකු වෙත තොරතුරු ලැබී ඇති බැවින් තාක්ෂණික ඇගයීම් කමිටුවක් මගින් නැවත ඇගයීමක් සිදුකරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | අනෙක් තරඟකාරී ආයතනයක් විසින් අදාල ප්‍රසම්පාදනය ප්‍රදානය නොකරන ලෙස ලිපියක් යොමුකර තිබීමෙන් ප්‍රසම්පාදන ලියකියවිලිවල රහස්‍යතාවය ආරක්ෂා වී නොතිබුණු බව නිරීක්ෂණය විය. | | |
| iii. | 2018 අගෝස්තු 13 දින ලංසු ප්‍රදානය සිදු කර තිබූ ආයතනය විසින් ඇනවුම ලැබී මාස 03 ක් තුලදී භාණ්ඩ සපයන බවට එකඟ වී තිබුණු නමුත් 2018 දෙසැම්බර් 31 දින දක්වා ජෙනරේටරය සපයා නොතිබුණි. | ගිවිසගත් කාලය තුල ප්‍රසම්පාදනය සම්පූර්ණ කරන ලෙස සැපයුම්කරු වෙත දැනුම් දීම අවශ්‍ය වේ. | කොන්ත්‍රාත්තුව ලබා ගත් ආයතනය ජෙනරේටරය නිෂ්පාදනය කර නැව් ගත කිරීමට මාස 04 ක් ගත වන බව දැනුම් දී තිබුණු බැවින් 2018 වර්ෂයේ ජේනරේටරය සැපයීමට නොහැකි වී තිබුණි. |
| (ඇ) | 2006 සඳහා වු අයවැය යෝජනාවක් අනුව ඩොප්ලර් රේඩාර් පද්ධතියක් පිහිටුවීම සඳහා උපරිම වශයෙන් රු.මිලියන 400 ක් අයෝජනය කිරීමට රජය තීරණය කර තිබුණි. 2008 වර්ෂ අවසන් වන විට මෙම යන්ත්‍රය මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය විසින්, ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ භාරකාර අරමුදලේ රු. මිලියන 320 ක මුදලක් තැන්පත් කර තිබුණි. 2011 වර්ෂයේ මෙරට ලැබී තිබුණු රේඩාර් පද්ධතිය 2014 වර්ෂයේ දී ස්ථාපිත කර තිබුණු නමුත් දිගු කලක් නිශ්කාර්යව පැවතීම හේතුවෙන් ක්‍රියාවිරහිතවී තිබුණි. 2018 අප්‍රේල් මාසයේදී ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ භාරකාර අරමුදලේ තව දුරටත් ඉතිරිව පැවති ඇ. ඩොලර් 1,063,946 ක මුදල උපයෝජනය කර ගනිමින් රේඩාර් පද්ධතිය අළුත් වැඩියා කර දීමට සැපයුම්කරු එකගවී තිබුණි. ඒ අනුව යන්ත්‍රයේ කොටස් අළුත්වැඩියා කටයුතු සඳහා ඇමරිකා එක්සත් ජනපදයේ නිෂ්පාදන සමාගම වෙත 2017 අප්‍රේල් 21 වන දින වන විට නැව්ගත කර තිබුණු අතර, ඒ | මේ සම්බන්ධව ඉකුත් වර්ෂයන් සඳහා වු විගණකාධිපති වාර්තා මඟින් අඩුපාඩු පෙන්වාදී තිබුණු නමුත් ක්‍රියාවලිය නිවැරදි කිරීම සඳහා විධිමත් පියවර ගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශ්වයන් හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වීම. | 2017 නැව්ගත කළ ඩොප්ලර් රේඩාර් පද්ධතිය අළුත්වැඩියාව සඳහා වැය වන ඇස්තමේන්තු මුදල ඇ.ඩො.1,095,935 බව නිෂ්පාදන සමාගම විසින් දන්වා ඇත. මේ පිළිබඳව ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ නියෝජිතයින් සමග අමාත්‍යාංශ ලේකම් හා අධ්‍යක්ෂ ජනරාල් විසින් සාකච්ඡා පවත්වා එම වියදම් ඇස්තමේන්තුව පිළිබඳ විශේෂඥයින් 07 දෙනෙකුගෙන් යුතු කමිටුවක් පත්කර ඇත. එම කමිටු වාර්තාව අනුව රේඩාර් පද්ධතිය අළුත්වැඩියා කිරීමට වැයවන මුදල සැලකු විට සහ එම උපකරණයේ තාක්ෂණය සැසඳු විට ඵලදායි නොවන බව වාර්තා කර ඇත. ලෝක කාලගුණ විද්‍යා සංවිධානය මගින් 2018 ජුනි 13 දිනැතිව කළ දැනුවත් කිරීම අනුව මෙම පද්ධතිය අළුත්වැඩියාවට වැය වන මුදල ඉතා ඉහල බැවින්ද වර්තමානයේදී තාක්ෂණය යල්පැන ගොස් ඇති බැවින්ද දෙපාර්තමේන්තුවට ප්‍රතිලාභයක් නොලැබේ. එබැවින් භාරකාර අරමුදලේ ශේෂව පවතින මුදල ආපසු මහා භාණ්ඩාගාරය වෙත ලබා ගැනීම ගිවිසුම් ප්‍රකාර ව්‍යාපෘතියේ ඉදිරි කටුයුතු සිදු කිරීම සඳහා නීතිමය උපදෙස් ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස්කර ඒ අනුව කටයුතු කරමින් පවති. |

සඳහා රු.5,644,398 ක අමතර පිරිවැයක් දරා තිබුණි. කෙසේ වුවද 2019 මැයි මාසය දක්වාම එය නැවත දෙපාර්තමේන්තුව වෙත ලැබී නොතිබුණි.

**4. තිරසර සංවර්ධන ඉලක්ක ලගා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව ඇතත් සමාලෝචිත වර්ෂයට අදාලව දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වී නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීමට හා ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කළ යුතු විම. | මේ සම්බන්ධව ඉදිරියේදි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. |

**5. යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලයේ අභ්‍යන්තර විගණක තනතුරක් ඇතුලත්ව තිබුණද, එම තනතුර පුරප්පාඩුව පැවතිණි. | අභ්‍යන්තර පාලන ක්‍රම විධිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර ගත යුතු වීම. | දිගින් දිගටම මෙම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට ඉල්ලීම් කර ඇත. |

**6.** **මානව සම්පත් කළමනාකරණය**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණ** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 460 ක් වූ අතර ඉන් තනතුරු 87ක් පුරප්පාඩුව පැවතුණි. දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, ඇතුළුව මාණ්ඩලික තනතුරු 11 ක් එම පුරප්පාඩු තුල ඇතුළත්ව තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කර දෙන ලෙස අදාල බලධාරීන්ගෙන් නිරන්තර ඉල්ලීම් කර ඇත. |